INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**2021 ජනවාරි 23**

**මාධ්‍ය නිවේදනය: ශ්‍රී ලංකාවට 'පාඨක හවුලක්'**

**ජොහැන්නස්බර්ග්:** ශ්‍රී ලංකාව තුල කිසියම් මානව හිමිකම් උල්ලංඝනයක් සැබවින්ම සිදුවීදැ'යි අතීත විමර්ශන සහ කොමිසන් මගින් අනාවරණය කොට ඇත්තේද කියා සොයා බැලීම සඳහා හය මාසයක් කාලය ගත කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ තවත් කොමිසමක් පත් කර තිබේ[1]. මෙය සිදුවී ඇත්තේ සංහිඳියාව සහ වගවීම ප්‍රවර්ධනය සඳහා 30/1 යෝජනාව යටතේ හවුලේ ඇතිකරගත් එකඟතා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේදැයි ලබන මාසයේ ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේදී පුනරීක්ෂණයට නියමිතව තිබියදීය.

*“ජාත්‍යන්තර පරිමානයේ බරපතල අපරාධ ශ්‍රී ලංකාවේ සිදුවුනිදැයි විමසා බැලීමට තවත් කොමිසමක් පත් කිරීමේ සිතුවිල්ලම ඒ සා විකාරයක් මෙන්ම වින්දිතයන්ට අපහාසයක්ද වන හෙයින්ම මෙය රැවටිල්ලක්දැයි කල්පනාවට නැගීම සමාව දිය හැකි කාරණයකි,”* යි සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය.

*“එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විධිනියෝගයෙන් 2015 දී කරන ලද විමර්ශනයකින් දැනටමත් අපරාධ චෝදනා ගොනුකිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රවේශ ලක්ෂ්‍යයක් පිහිටුවා ඇති අතර, යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ මෙන්ම ඒවා සිදුකිරීමේ ආණ්ඩුවේ භූමිකාව සඳහා වන නඩු නිමිත්තකටද පැහැදිලි කරුණු දක්වා තිබේ. ශ්‍රී ලංකාව කවුන්සිලයේ න්‍යාය පත්‍රයට ඇතුළු වී සිටින්නේම විසඳුම් ලැබී නැති කෙලෙසීම් සහ අපරාධවල බරපතල කම ආණ්ඩුව විසින්ම පිළිගෙන තිබෙන නිසාය.”*

කලින් පත් කරන ලද කොමිෂන් සභා වලින් අනාවරණය කරගන්නා ලද්දේ මොනවාදැයි හඳුනාගෙන එම නිර්දේශ ක්‍රියාත්මක කරන ලද්දේදැයි නව කොමිසම මගින් දැනගැනීමටත් ජනාධිපතිවරයාට අවශ්‍ය වී තිබේ.

*“මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය විසින් කරන ලද විමර්ශනයේ (A/HRC/30.CRP.2) නිර්දේශ දැක්වෙන පිටු 4 පමණක් පුනරීක්ෂණය කිරීමේ සරල කටයුත්තෙන් අතීත*

---

[1] Available at https://colombogazette.com/2021/01/22/three-member-panel-appointed-to-probe-findings-of-former-war-commissions/
“(a) Find out whether preceding Commissions of Inquiry and Committees which have been appointed to investigate into human rights violations, have revealed any human rights violations, serious violations of the international humanitarian law and other such serious offences;
(b) Identify what are the findings of the said Commissions and Committees related to the serious violations of human rights, serious violations of international humanitarian laws and other such offences and whether recommendations have been made on how to deal with the said facts;
(c) Manner in which those recommendations have been implemented so far in terms of the existing law and what steps need to be taken to implement those recommendations further in line with the present Government policy…”

*කොමිසම් විසින් අනාවරණය කරගන්නා ලද දේ වටහා ගැනීමට හැකියාව තිබියදී කොමිසමක් පත් කිරීම විහිළුවකි." යි යැස්මින් සූකා පැවසුවාය. "නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගතහොත් - එය සිදුවී නැති බව මැනවින් පැහැදිලිය. යුක්තිය හා වගවීම සම්බන්ධයෙන් ස්වකීය ජනතාවටත් මානව හිමිකම් කවුන්සිලයටත් දෙන ලද පොරොන්දු ශ්‍රී ලංකාවේ දිගටම පැවති ආණ්ඩු විසින් කඩ කොට තිබේ. වගවීම, ජාතික සුවපත් වීම සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට සංක්‍රාන්ති යුක්තිය සඳහා වන අංගසම්පූර්ණ සාකල්‍යවාදී වැඩ රාමුවක් වෙනුවෙන්, 30/1 යෝජනාවත්, ඉන් පසුව ආ යෝජනාත්, ශ්‍රී ලංකා රජයේ එකඟතාව ඇතිව සම්මත කරගන්නා ලදී."*

නව ජනාධිපති කොමිසමේ නියමයන් අපැහැදිලි ලෙස කෙටුම්පත් කර ඇත්තේ විමර්ශනය කළ යුත්තේ කවර කාලයක සිදුකරන ලද උල්ලංඝන සම්බන්ධයෙන්දැයි කාල රාමුවක් දක්වන්නේ නැතිවය.

*"ශ්‍රී ලංකාවට එරෙහි යුද අපරාධ චෝදනා කියවීමේ පාඨක හවුලකට වැඩිමනත් දෙයක් නොවන මෙය පත් කර ඇත්තේ අපරාධ සිදුවූ බවට චෝදනා නැගෙන සමයේ ආරක්ෂක ලේකම් ලෙස තීරණාත්මක කාර්යභාරයක් ඉෂ්ඨ කළ බව කියැවෙන පුද්ගලයාම විසිනි," යි යැස්මින් සූකා පැවසුවාය.*

අලුත් කොමිසමට නායකත්වය දෙන්නේ අඩුම වශයෙන් හතර වාරයක් (2010 නොවැම්බර්[2], 2011 ජූනි[3], 2011 සහ 2013 සැප්තැම්බර්[4]) එක්සත් ජාතීන් හමුවේ ශ්‍රී ලංකාවේ රජයේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී හිඳිමින් රඟපෑ භූමිකාව නිසා සබැඳියාවන් අතර ගැටුම් ගණනාවක් ඇති බව පෙනී යන විනිශ්චයකාරවරයෙකි. එක් වතාවක් ඒ. එච්. එම්. ඩී නවාස් ජිනීවා නුවරට ගිය ශ්‍රී ලංකා රජයේ නියෝජිත මණ්ඩලයේ[5] සාමාජිකයෙක් විය. විදේශ අමාත්‍යාංශය ප්‍රකාශ කළ පරිදි එකී නියෝජිත පිරිස ජිනීවා ගියේ "දෝෂ සහගත" එක්සත් ජාතීන්ගේ විශේෂඥ මණ්ඩලයේ වාර්තාවට විරුද්ධව යෝජනාවක් සභාගත කිරීමටය.

මහ ලේකම් බැන්කි මූන් විසින් එක්සත් ජාතීන්ගේ විශේෂඥ මණ්ඩලය පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසාන කාල පරිච්ඡේදයේදී සිදුවූ බවට චෝදනා කෙරෙන ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂික නීති උල්ලංඝන සම්බන්ධයෙන් වගවීම පිළිබඳව ඔහුට වාර්තා කිරීම සඳහායි[6]. "යුද්ධයේදීත්, සාමයේදීත් පුද්ගලික ගරුත්වය ආරක්ෂා කිරීම අරමුණු කොටගත් සමස්ත ජාත්‍යන්තර නීති සමුදායම මත්තේ දියත් කෙරුණු මාරාන්තික ප්‍රහාරයක් යුද්ධය පවත්වා ගෙන ගිය ආකාරයෙන් නිරූපනය කෙරේ," යන්න විශේෂඥ මණ්ඩලයේ නිගමනය විය. මණ්ඩලයේ වාර්තාව 30/1 යෝජනාවට පිටුබලය සැපයූ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනයට අන්තිමේදී මග පෑදූ අතර, දැන් එය මානව හිමිකම් කවුන්සිලයේ පුනරීක්ෂණයට ලක් වීමට නියමිතය.

*"තමන් විවෘතවම විරුද්ධව පෙනී සිටි එක්සත් ජාතීන්ගේ වාර්තා අපක්ෂපාතීව විමර්ශනය කිරීමේ හැකියාව මේ කොමිසමේ ප්‍රධානියාට නැත. ඊට අමතරව ඔහු ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින නීතිඥයා මෙන්ම අභිචෝදකයා ලෙසින්ද ද්විත්ව රංගනයක යෙදෙන නීතිපති දෙපාර්තමේන්තුවේද[7] පාර්ශවකාරයකු වී ඇත," යි යැස්මින් සූකා පැවසුවාය.*

අලුත් කොමිසමේ තවත් සාමාජිකයකු ලෙස පත් කර ඇත්තේ දේශපාලන පලිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද මහත් දේශපාලනීකරණයට ලක් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ මෑතක් වනතුරු සාමාජිකයකුව සිටි හිටපු පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දුය[8]. පසුගිය ආණ්ඩුව යටතේ පවරන ලද දේශපාලනික බවට චෝදනා කෙරෙන නඩු සම්බන්ධ එම කොමිසමේ අවසන් වාර්තාව තවමත් ප්‍රසිද්ධියට පත් කොට නැත. දේශපාලන පලිගැනීම් කොමිසම හමුවට ආ පැමිණිලි ගණනාවක් විභාග කිරීම නිසා හිටපු පොලිස්පති ප්‍රනාන්දුටද සබැඳියාවන් අතර ගැටුමක් පවතී. 2004-6 සමයේ පොලිස් ප්‍රධානියා වී සිටි චන්ද්‍රා ප්‍රනාන්දු එම කාලය තුල පොලිසියට එරෙහිව එල්ලවන චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ

---

[2] https://tbinternet.ohchr.org/Treaties/CESCR/Shared%20Documents/LKA/INT_CESCR_LOP_LKA_45_10705_E.pdf

[3] https://www.lankamission.org/images/pdf/Statement%20by%20Deputy%20Solicitor%20General%20during%20the%20interactive%20dialogue%20with%20the%20SR%20on%20Trafficking%20in%20Persons%20especially%20Women%20and%20Children%201%20June%202011.pdf

[4] https://www.lankamission.org/human-rights-humanitarian-affairs/167-sri-lanka-empathetic-to-the-many-challenges-faced-by-sudan-in-its-progression-towards-normalcy.html
https://www.lankamission.org/images/Statement_Sudan%20-sep%202013.pdf

[5] https://mfa.gov.lk/many-states-flay-flawed-darusman-report/

[6] One of the members of the Panel was Yasmin Sooka.

[7] http://www.attorneygeneral.gov.lk/index.php/history

[8] https://www.presidentsoffice.gov.lk/index.php/2020/12/08/report-of-the-commission-to-investigate-political-victimization-handed-over-to-president/

පැවැත්වීමට යෝග්‍ය අපක්ෂපාතී සහ ස්වාධීන අයකු ලෙස සුදුසුකම් ලබන්නේ නැත[9]. ඔහු ධුරයේ සිටි කාලයේ විමර්ශන පැවැත්වීමේදී දැක්වූ අසමත්කම පිළිබඳව ශ්‍රී ලාංකික ක්‍රියාධරයන් ප්‍රශ්න නගා තිබේ[10].

*“හුදෙක් වසන් කිරීමක් සහ කාලය නාස්ති කිරීමක් වන මේ කොමිසමට කිසියම්ම හෝ පිළිගැනීමක් ලබා දෙතොත් එය සමස්ත එක්සත් ජාතීන්ගේ කාර්යදාමයම අනතුරේ හෙළීමක් වනු ඇත,” යි යැස්මින් සූකා වැඩිදුරටත් පැවසුවාය.*

[9] http://www.humanrights.asia/news/ahrc-news/AS-241-2006/
https://www.police.lk/index.php/library/item/180-inspector-general-of-police
[10] https://www.bbc.com/sinhala/news/story/2005/05/printable/050530_bindunuwewa_ahrc
https://www.wsws.org/en/articles/2006/10/sril-o07.html
https://www.bbc.com/sinhala/news/story/2006/10/printable/061001_tamil_abductions

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT